# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 26 දරන
# මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1992 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ: ශත 60 යි. තැපැල් ගාස්තුව: රු. 1 00 යි.

# 1992 අංක 26 දරන මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 17/91

**මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ සහ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මොරටුවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 26 දරන මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන්, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද එකී නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද නම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. මොරටුවේ නව තරුණ ක්‍රිස්තියානි සංගමය සංස්ථාගත කිරීම.

3. මොරටුවේ තරුණයන්ගේ අධ්‍යාත්මික, බුද්ධිමය, සමාජමය සහ ශාරීරික ප්‍රවර්ධනය ඇති කිරීම සංස්ථාව සංස්ථාපනය කිරීමේ පොදු පරමාර්ථය බව ප්‍රකාශ කරනු ලැබේ. සංස්ථාවේ පොදු පරමාර්ථ.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීමද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලු ම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ සාමාන්‍ය බලතල.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි තෝරා පත් කර ගනු ලබන සහ ඒ රීතිවලට අනුකූල සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන, අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු එකී රීතිවලට යටත්ව කළමනාකරණය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය වන්නේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, සංස්ථාවේ සාමාන්‍ය සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ හතරෙන් තුනකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවති සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන තාක් දුරට, මේ පනත යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාව විසින් සාදන ලද රීති, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, ඒ දිනයේ දී, සංගමයට අය විය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල සහ චංචල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහිලා සංස්ථාවට බලය ඇති අතර ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

9. සංස්ථාවේ රීතිවලින් සලස්වා ඇති විධිවිධානවලට අනුකූල සාමාජික සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර ඒ සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට අමතරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.